කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී ගෞරව උපාධි පරීක්ෂණය, පළමු වසර

දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2023

**LAW 12305 - සාධාරණත්වය සහ භාර නීතිය**

(පැ දෙකයි මිනිත්තු 15යි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **04**

ඕනෑම ප්‍රශ්න <u>දෙකකට **(02)**</u> පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1) පහත පැවරීම් මඟින් වලංගු භාරයක් නිර්මාණය කර ඇත්දැයි ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ අධිකාරීන් සමඟ සාකච්ඡා කරන්න:

අ. අරුන්, කුමාර්ව රු. මිලියන 5ක් සඳහා භාරකරුවෙකු ලෙස පත් කර, ඉන් නිවසක් මිලදී ගන්නා ලෙසත් අරුන්ගේ ලේලිය, අරුන්ගේ ගමෙන් නම් ඇයට එය පවරා දෙන ලෙසත් ඔහුට උපදෙස් ලබා දුන්නේය.

(ලකුණු 7)

ආ. සමන්, තම විශ්‍රාම වැටුප් අරමුදල ඉන්දියාවෙන් ගංජා ජාවාරම් කිරීමෙහි ආයෝජනය කිරීමටත් එයින් ලැබෙන ලාභය තම (සමන්ගේ) දරුවන්ගේ අර්ථලාභයට යෙදවීමටත් භාරයක් නිර්මාණය කළේය.

(ලකුණු 7)

ඇ. විසලි ඇගේ ආපන ශාලාව සහ තේ වත්ත කන්නන්ට පවරා දී කන්නන් වඩාත් සුදුසු යැයි සිතන ඇගේ සහෝදරයන්ගේ දරුවන්ට එම දේපළ බෙදා දීමට ඔහුට නියම කළාය.

(ලකුණු 7)

ඈ. සාවිත්‍රි ඇගේ සාප්පුව ඇගේ සොහොයුරිය වන සුමනාට පැවරූ අතර වයස අවුරුදු දහඅට පිරුණු පසු සාවිත්‍රිගේ දියණිය වන මාලිනීට සාප්පුව පවරන ලෙස ඇයට නියම කළාය. මාලිනීට වයස අවුරුදු දහඅට පිරුණත්, සුමනා සාප්පුව මාලිනීට පවරා නොදී රඳවා තබා ගනියි. භාර

ආඥාපනතේ 5(1) වගන්තිය යටතේ අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති බැවින් භාරයක් නොපවතින බව සුමනා තර්ක කරයි.

(ලකුණු 9)

(මුළු ලකුණු 30)

2) ශිවාගේ පහත පැවරීම් මඟින් පුණ්‍ය භාර නිර්මාණය කරන්නේද යන්න අදාළ නඩු තීන්දු සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සමඟ සාකච්ඡා කරන්න:

අ. 01 ශ්‍රේණියේ දුප්පත් සිසුන්ට පෝෂ්‍යදායී උදෑසන ආහාරය ලබාදීම සඳහා ශාන්ත ක්ලෙයාර් පාසලේ නේවාසිකාගාරයේ පාලිකාවට රුපියල් මිලියන 05ක්;

ආ. රත්නපුර දිස්ත්‍රික්කයේ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා ලිපි ද්‍රව්‍ය ලබාදීමට රුපියල් මිලියන 12ක්;

ඇ. රට තුළ රජය සතු ව්‍යාපාර පෞද්ගලිකරණය කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම සඳහා රුපියල් මිලියන 15ක්; සහ

ඈ. මගේ මවගේ ආත්මයට මෝක්ෂය පතා මගේ ගමේ ශිවන් කෝවිලේ වාර්ෂිකව පූජාවක් පැවැත්වීමට මගේ පුතා පරන්ට රුපියල් මිලියන 05ක්.

(7.5 × 4 = ලකුණු 30)

3) "... අනුමිත භාරයක් යනු භාරකරුගේ අයුතු හැසිරීම හේතුවෙන් නීතිය ඔහු මත පනවා ඇති භාරයකි". (Westdeutsche Landesbank [1996], Lord Browne Wilkinson)
භාර ආඥාපනතේ IX පරිච්ඡේදයේ අදාළ ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් ඉහත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න.

(ලකුණු 30)

4) කුමාර් තම පුතුන් දෙදෙනා වන සුරාජ් සහ විරාජ්ගේ අර්ථලාභය සඳහා නුවරඑළියේ ඔහුගේ තේ වත්ත සහ නිවාඩු නිකේතනය සඳහා භාරයක් නිර්මාණය කළේය. කුමාර් භාරයේ සම භාරකරුවන් ලෙස සනේෂ්, මිතුන් සහ රෙහාන් පත් කළේය. තේ වත්තෙන් ලැබෙන ආදායම ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට කුමාර් භාරකරුවන්ට බලය පවරා ඇත. ඉහළ ලාභ සහ ඉහළ අවදානම් සහිත මාර්ගගත විදේශ මුදල් ව්‍යාපාරයක් ගැන සුරාජ්ට දැනගන්නට ලැබුණි. තේ වත්තෙන් ලැබෙන ආදායම මාර්ගගත විදේශ මුදල් ව්‍යාපාරයේ ආයෝජනය කරන ලෙස සුරාජ් සනේෂ්ට සහ මිතුන්ට ඒත්තු ගැන්විය. මාර්ගගත විදේශ මුදල්

ව්‍යාපාරයේ ආයෝජනය රෙහාන්ට සහ විරාජ්ට හෙළි නොකරන ලෙස සූරාජ් සනේෂ්ගෙන් සහ මිතුන්ගෙන් ඉල්ලා සිටියේය. සනේෂ් සහ මිතුන් සූරාජ්ගේ සැලැස්මට එකඟ වීම සඳහා ලාභයෙන් කොටසක් ඉල්ලා සිටියහ. සනේෂ් සහ මිතුන් කළ ඉල්ලීමට සූරාජ් එකඟ විය. මාර්ගගත විදේශ මුදල් ව්‍යාපාරයෙන් ඔවුහු විශාල අලාභයක් ලැබූහ. සනේෂ් සහ මිතුන් භාරය පිළිබඳව දන්නා තම සමීපතම මිතුරා වූ නිශාල්ට නිවාඩු නිකේතනය විකුණූහ. සූරාජ්ගේ කැමැත්ත ඇතිව වෙළෙඳපොළ වටිනාකමට වඩා බෙහෙවින් අඩු අගයකට එම විකිණීම සිදු විය. පසුව සනේෂ්, මිතුන් සහ සූරාජ් අලෙවියෙන් ලත් මුදල බෙදා ගත්හ. රෙහාන් තමාගේම ව්‍යාපාරයක කාර්යබහුල වූ බැවින් භාරකරුවෙකු ලෙස ඔහුගේ රාජකාරිය අතපසු කළේය. භාර ලේඛනයට සහ භාර ආඥාපනතට එරෙහිව සිදු වූ ආයෝජන සහ ගනුදෙනු පිළිබඳව විරාජ් දැනගත් අතර සනේෂ්, මිතුන්, රෙහාන්, සූරාජ් සහ නිශාල්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරයි.

භාර ආඥා පනතේ ප්‍රතිපාදන සහ ඔහුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විරාජ් ඔබේ උපදෙස් පතයි. භාර ආඥා පනතේ ප්‍රතිපාදන උපුටා දක්වමින් විරාජ්ට උපදෙස් දෙන්න.

(ලකුණු 30)

*****